244316

AL/2016/12/S

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2016

**සාමාන්‍ය පොදු පරීක්ෂණය**
பொதுச் சாதாரணப் பரீட்சை
Common General Test

**12** **S**

*පැය දෙකයි මිනිත්තු තිහයි*
*இரண்டு மணித்தியாலமும் முப்பது நிமிடமும்*
*Two hours and thirty minutes*

**උපදෙස්:**
* පිටු අංක පිළිවෙළට ප්‍රශ්න පත්‍රය සකස් කරගන්න.
* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* **ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.**
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් සැලකිලිමත් ව කියවන්න.
* **1** සිට **60** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි** හෝ **ඉතාමත් ගැළපෙන** පිළිතුර තෝරා ගෙන, එය **උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (×) **යොදා දක්වන්න.**

**1.** 2016 වර්ෂයේ ICC විස්සයි 20 ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලිය ජයග්‍රහණය කළේ,
(1) එංගලන්තය ය. (2) බටහිර ඉන්දීය කොදෙව් ය. (3) ඉන්දියාව ය.
(4) ශ්‍රී ලංකාව ය. (5) ඕස්ට්‍රේලියාව ය.

**2.** දිවංගත සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මියගේ 100 වන ජන්ම දිනය 2016 අප්‍රේල් 17 වැනි දින සමරන ලදී.
(1) ඇය අග්‍රාමාත්‍ය ධුරය දැරූ ලෝකයේ ප්‍රථම කාන්තාවයි.
(2) ඇය ජනාධිපති ධුරය දැරූ ලෝකයේ ප්‍රථම කාන්තාවයි.
(3) ඇය ශ්‍රී ලංකාවේ ප්‍රථම ජනාධිපතිවරියයි.
(4) ප්‍රථම වරට ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍ය ධුරය දැරුවේ ඇයයි.
(5) ඇය ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායක ධුරය දැරූ ප්‍රථම කාන්තාවයි.

**3.** ශ්‍රී ලංකාවේ සුප්‍රසිද්ධ සිවිල් ඉංජිනේරුවකු හා නිර්මාණකරුවකුගේ ජන්ම දිනය වන ඔක්තෝබර් 26 දිනය ශ්‍රී ලංකාවේ නව නිපැයුම්කරුවන්ගේ දිනය ලෙස ප්‍රකාශයට පත් කිරීමට ශ්‍රී ලංකා රජය තීරණය කර ඇත. මෙම පුද්ගලයාගේ නම කුමක් ද?
(1) සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නංගර (2) ඩී. ජේ. විමලසුරේන්ද්‍ර (3) ඒ. එන්. එස්. කුලසිංහ
(4) උපාලි විජේවර්ධන (5) ජෙෆ්රි බාවා

**4.** ශ්‍රී ලංකාවට නව ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීම සඳහා 2016 අප්‍රේල් මාසයේ දී ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව ව්‍යවස්ථාදායක සභාවක් ලෙස කැඳවන ලදී. ව්‍යවස්ථාදායක සභාවේ මුලසුන හොබවන්නේ,
(1) අග්‍රාමාත්‍යවරයා ය. (2) පාර්ලිමේන්තුවේ කථානායකවරයා ය.
(3) අධිකරණ අමාත්‍යවරයා ය. (4) පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ අමාත්‍යවරයා ය.
(5) පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකයා ය.

**5.** 2016 පෙබරවාරි මාසයේ, සෙයිද් රාද් අල් හුසේන් කුමරු එක්සත් ජාතීන්ගේ (UN) සංවිධානයේ සිය ධුරයේ නිල කාර්යය පිණිස ශ්‍රී ලංකාවට පැමිණියේ ය. ඔහු,
(1) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ, මානව හිමිකම් පිළිබඳ මහා කොමසාරිස්වරයා ය.
(2) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ, සරණාගතයින් පිළිබඳ මහා කොමසාරිස්වරයා ය.
(3) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ, ගෝලීය අධ්‍යාපනය පිළිබඳ විශේෂ නියෝජිතයා ය.
(4) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ, තාරුණ්‍යය හා ක්‍රීඩා පිළිබඳ විශේෂ නියෝජිතයා ය.
(5) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ළමා අරමුදලේ විධායක අධ්‍යක්ෂවරයා ය.

**6.** XII වන දකුණු ආසියානු ක්‍රීඩා උළෙල 2016 පෙබරවාරි මාසයේ පැවැත්විණි. එහි සත්කාරක රට වූයේ,
(1) නේපාලය ය. (2) පාකිස්ථානය ය. (3) ශ්‍රී ලංකාව ය.
(4) බංග්ලාදේශය ය. (5) ඉන්දියාව ය.

**7.** එක්සත් ජනපද රජයේ ජ්‍යෙෂ්ඨ නියෝජිතයකු වන ජෝන් කෙරී, දෙරට අතර සබඳතා අලුත් කරගැනීම සඳහා 2015 මැයි මාසයේ ශ්‍රී ලංකාවට පැමිණියේ ය. ඔහු එසේ ශ්‍රී ලංකාවට පැමිණියේ එක්සත් ජනපද රජයේ කුමන ධුරයක් හොබවන්නකු ලෙස ද?
(1) රාජ්‍ය ලේකම් (2) භාණ්ඩාගාර ලේකම් (3) ආරක්ෂක ලේකම්
(4) කෘෂිකර්ම ලේකම් (5) කම්කරු ලේකම්

**8.** 2015 අගෝස්තු මාසයේ දී ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා විසින් විශ්‍රාමික ටෙස්ට් ක්‍රිකට් ක්‍රීඩකයකු, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සන්නාම තානාපති ලෙස පත් කරන ලදී. එම ක්‍රිකට් ක්‍රීඩකයාගේ නම කුමක් ද?
(1) රොෂාන් මහානාම (2) මහේල ජයවර්ධන (3) සනත් ජයසූරිය
(4) කුමාර් සංගක්කාර (5) දුලීප් මෙන්ඩිස්

[දෙවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

**9.** සීකා (Zika) වෛරසයේ ව්‍යාප්තිය යනු කඩිනම් ක්‍රියාමාර්ග අවශ්‍ය වන, ජාත්‍යන්තර අවධානයට ලක් වූ, මහජන සෞඛ්‍යය පිළිබඳ හදිසි තත්ත්වයක් බව 2016 පෙබරවාරි මස ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) ප්‍රකාශ කර සිටියේ ය. මෙම වෛරසයෙන් මිනිසුන් ආසාදිත වන්නේ ප්‍රධාන වශයෙන්,
(1) ආසාදිත මදුරුවන් හරහා ය. (2) අපිරිසිදු පෘෂ්ඨයක් ස්පර්ශ කිරීමෙන් ය. (3) පානීය ජලය මගින් ය.
(4) අපිරිසිදු කිරි නිෂ්පාදන මගින් ය. (5) ආහාර මගින් ය.

**10.** එන්නත් කිරීම මගින් වැළැක්විය හැකි **නො වන්නේ** පහත දැක්වෙන කුමන රෝගය ද?
(1) ජලභීතිකාව (2) පැපොල (3) දියවැඩියාව (4) පෝලියෝ (5) සරම්ප

**11.** ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) මූලස්ථානය පිහිටියේ,
(1) පිලිපීනයේ ය. (2) ඉන්දුනීසියාවේ ය. (3) තායිලන්තයේ ය.
(4) ඉන්දියාවේ ය. (5) ජපානයේ ය.

**12.** ගෝලීය තාරුණ්‍ය දුම්කොළ සමීක්ෂණය (GYTS) පාසල් ළමයින් අතර දුම්කොළ භාවිතය අධීක්ෂණය කිරීම සඳහා පාසල් පදනම් කරගෙන ලොව පුරා රටවල කරනු ලබන සමීක්ෂණයකි. 2015 වර්ෂයේ දී GYTS ශ්‍රී ලංකාවේ පවත්වනු ලැබුවේ අධ්‍යාපන අමාත්‍යාංශයේ හා සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහයෝගිතාවෙනි. GYTS ආරම්භ කරන ලද්දේ,
(1) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) විසිනි.
(2) එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන, විද්‍යාත්මක හා සාංස්කෘතික සංවිධානය (UNESCO) විසිනි.
(3) ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) විසිනි.
(4) ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) විසිනි.
(5) එක්සත් ජාතීන්ගේ කර්මාන්ත සංවර්ධන සංවිධානය (UNIDO) විසිනි.

**13.** ශ්‍රී ලංකාවේ ඉදි වූ ප්‍රථම සෆාරි උද්‍යානය 2016 මාර්තු මස විවෘත කරන ලදි. එය පිහිටා ඇත්තේ,
(1) හම්බන්තොට දිස්ත්‍රික්කයේ රිදියගම ය. (2) පුත්තලම දිස්ත්‍රික්කයේ කල්පිටියේ ය.
(3) කෑගල්ල දිස්ත්‍රික්කයේ පින්නවල ය. (4) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මින්නේරියේ ය.
(5) යාපනය දිස්ත්‍රික්කයේ ඩෙල්ෆ්ට්හි ය.

**14.** ඇමරිකානු ඩොලර්, යූරෝ, බ්‍රිතාන්‍ය පවුම්, ජපාන යෙන් යන මුදල් වර්ග හතරට අමතර ව ලෝකයේ විශිෂ්ට මූල්‍ය ඒකක යටතට නව මුදල් වර්ගයක් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් මෑතක දී හඳුන්වා දෙන ලදි. එම මුදල් වර්ගයේ නම කුමක් ද?
(1) චීන රෙන්මින්බි (2) චීන යුආන් (3) සවුදි ඩිනාර් (4) පිලිපීන පෙසෝ (5) රුසියානු රූබල්

**15.** "අධ්‍යාපන ආයතනයන්හි නවක වදය හා වෙනත් ස්වරූපයේ සාහසික ක්‍රියා තහනම් කිරීමේ 1998 අංක 20 දරන පනත" පාර්ලිමේන්තුව මගින් සම්මත කර ඇත. එම පනතට අනුව, පහත සඳහන් කවරක් දඬුවම් ලැබිය හැකි වරදක් **නො වන** බවට සැලකිය හැකි ද?
(1) අධ්‍යාපන ආයතන ඇතුළත දී හෝ පිටත දී හෝ නවක වදය සිදු කිරීම හෝ නවක වදයට සහභාගි වීම
(2) නවක වදය සිදු කරන අතර වාරයේ දී අධ්‍යාපන ආයතනයක සිසුවකුට හෝ කාර්ය මණ්ඩලයේ සාමාජිකයකුට හෝ ලිංගික අතවරයක් හෝ බරපතල තුවාලයක් හෝ සිදු කිරීම
(3) සිසුවකුගේ හෝ කාර්යමණ්ඩල සාමාජිකයකුගේ හෝ කීර්තිනාමයට හානි කිරීමේ අරමුණින් වාචික ව හෝ ලිඛිත ව හෝ තර්ජනය කිරීම
(4) අධ්‍යාපන ආයතනයක් තුළ පවතින ඕනෑ ම පරිශ්‍රයක බලහත්කාරයෙන් පදිංචි වීම
(5) අධ්‍යාපන ආයතනයක් තුළ අධ්‍යාපන පෝස්ටර් ප්‍රදර්ශනය කිරීම

**16.** 2016.01.01 දිනය සිකුරාදා දවසකි. 2018.01.01 දිනය
(1) ඉරිදා දවසකි. (2) සඳුදා දවසකි. (3) අඟහරුවාදා දවසකි.
(4) බදාදා දවසකි. (5) බ්‍රහස්පතින්දා දවසකි.

**17.** රුපියල් දෙකේ කාසි 4 කත්, රුපියලේ කාසි 2 කත් බර රුපියල් දෙකේ කාසි 2 කත් රුපියලේ කාසි 6 කත් බරට සමාන නම්, රුපියලේ කාසියක බර,
(1) රුපියල් දෙකේ කාසියක බරෙන් $\frac{1}{4}$ කි. (2) රුපියල් දෙකේ කාසියක බරෙන් $\frac{1}{3}$ කි.
(3) රුපියල් දෙකේ කාසියක බරෙන් $\frac{2}{3}$ කි. (4) රුපියල් දෙකේ කාසියක බරෙන් $\frac{1}{2}$ කි.
(5) රුපියල් දෙකේ කාසියක බරෙන් $\frac{3}{4}$ කි.

**18.** වෛද්‍යවරයකු රෝගියකුට ඖෂධ වර්ග දෙකක් නියම කර ඇත්තේ දින හතක් තුළ පළමු වර්ගය පැය හයකට වරක් ගන්නා ලෙසත්, දෙවන වර්ගය පැය අටකට වරක් ගන්නා ලෙසත් ය. රෝගියා පළමු දිනයේ පෙ. ව. 6 ට ඖෂධ වර්ග දෙක ම ගත්තේ නම්, එම ඖෂධ වර්ග දෙක ම නැවත එක වර ගන්නේ කුමන වේලාවේ දී ද?
(1) එදින ම මධ්‍යාහ්න 12 ට (2) එදින ම ප. ව. 4 ට (3) එදින ම ප. ව. 8 ට
(4) එදින ම ප. ව. 10 ට (5) පසු දින පෙ. ව. 6 ට

**19.** දුම්රිය කාලසටහනට අනුව A දුම්රිය ස්ථානයෙන් නියමිත වේලාවට පිටත් වන ඕනෑ ම දුම්රියක් 40 km $h^{-1}$ ක සාමාන්‍ය වේගයක් පවත්වා ගතහොත් B දුම්රිය ස්ථානයට නියමිත වේලාවට ළඟා විය හැකි ය. කිෂාණි ගමන් කළ දුම්රිය A දුම්රිය ස්ථානයෙන් මිනිත්තු 15 ක් ප්‍රමාද ව පිටත් වී 45 km $h^{-1}$ ක සාමාන්‍ය වේගයක් පවත්වා ගනිමින් නියමිත වේලාවට B දුම්රිය ස්ථානයට ළඟා විය. A හා B දුම්රිය ස්ථාන දෙක අතර දුර කොපමණ ද?
(1) 90 km (2) 60 km (3) 56 km (4) 48 km (5) 45 km



Department of Examinations Sri Lanka

**20.** ගැහැනු ළමයින් 128 දෙනකු හා පිරිමි ළමයින් 96 දෙනකුගෙන් සමන්විත පන්තියක් කණ්ඩායම් කිහිපයකට වෙන් කළ යුතු ව ඇත්තේ කණ්ඩායමක සිටින පිරිමි ළමයින් ගණන හා ගැහැනු ළමයින් ගණන අනුබද්ධයෙන් කණ්ඩායම් සර්වසම වන පරිදි ය. එලෙස සකස් කළ හැකි උපරිම කණ්ඩායම් ගණන කීය ද?

(1) 2 (2) 4 (3) 24 (4) 32 (5) 48

● ප්‍රශ්න අංක **21, 22** සහ **23,** පහත දී ඇති තොරතුරු මත පදනම් වේ.

සිමෙන්ති ගඩොල් 800 කින් සමන්විත බිත්තියක් බැඳීමට සහ එහි දෙපැත්ත කපරාරු කිරීමට පෙදරේරුවන් දෙදෙනකු කුලියට ගන්නා ලදී. පළමු පෙදරේරුවා පැයට ගඩොල් කැට 100 ක ශීඝ්‍රතාවකින් ගඩොල් බඳින අතර, පැයට ගඩොල් කැට 50 ක ශීඝ්‍රතාවකින් ඒවායේ දෙපැත්ත ම කපරාරු කරයි. දෙවන පෙදරේරුවා පැයට ගඩොල් කැට 60 ක ශීඝ්‍රතාවකින් ගඩොල් බඳින අතර, පැයට ගඩොල් කැට 75 ක ශීඝ්‍රතාවකින් ඒවායේ දෙපැත්ත ම කපරාරු කරයි. පෙදරේරුවෝ දෙදෙනා ම ගඩොල් බැඳීමෙන් වැඩ ආරම්භ කළහ. දෙදෙනා ම එක් ව ගඩොල් 400 ක් බැඳීමෙන් පසු දෙවන පෙදරේරුවා බිත්ති කපරාරු කිරීම ආරම්භ කළ අතර, පළමු පෙදරේරුවා ඉතිරි ගඩොල් බැඳීම කරගෙන ගියේ ය. පළමු පෙදරේරුවා ගඩොල් සියල්ල ම බැඳ අවසන් කළ පසු, කාර්යය සම්පූර්ණ වන තෙක් දෙවන පෙදරේරුවා සමග කපරාරුවෙහි යෙදුණේ ය.

**21.** පළමු පෙදරේරුවා සිමෙන්ති ගඩොල් බැඳීමට ගත කළ කාලය කොපමණ ද?

(1) පැය 8 යි (2) පැය 7 යි මිනිත්තු 30 යි (3) පැය 6 යි මිනිත්තු 30 යි
(4) පැය 6 යි (5) පැය 5 යි මිනිත්තු 30 යි

**22.** පෙදරේරුවන් දෙදෙනා ම එක විට බිත්ති කපරාරුවේ යෙදුණු කාලය කොපමණ ද?

(1) පැය 2 යි (2) පැය 2 යි මිනිත්තු 30 යි (3) පැය 3 යි මිනිත්තු 30 යි
(4) පැය 4 යි (5) පැය 6 යි

**23.** කාර්යය සම්පූර්ණ කිරීමට ගත වූ කාලය කොපමණ ද?

(1) පැය 8 යි (2) පැය 8 යි මිනිත්තු 30 යි (3) පැය 9 යි මිනිත්තු 30 යි
(4) පැය 10 යි (5) පැය 10 යි මිනිත්තු 30 යි

**24.** එක එකක් නියත ශීඝ්‍රතාවන්ගෙන් ජලය පොම්ප කරන පොම්ප දෙකකින් හිස් පිහිනුම් තටාකයක් සම්පූර්ණයෙන් පිරවීමට පැය 3 ක කාලයක් ගත වේ. පළමු පොම්පය මගින් පමණක් තටාකය සම්පූර්ණයෙන් පිරවීමට පැය 5 ක් ගත වේ. දෙවන පොම්පය මගින් පමණක් තටාකය පිරවීමට කොපමණ කාලයක් ගත වේ ද?

(1) පැය 6 යි (2) පැය $6\frac{1}{2}$ යි (3) පැය 7 යි (4) පැය $7\frac{1}{2}$ යි (5) පැය 8 යි

**25.** රමේෂ්, ක්‍රිකට් පිටියක පන්දු යවන්නාගේ කෙළවරෙහි පිහිටි කඩුල්ල අසලින් ගමන් අරඹමින් නැගෙනහිර දෙසට 5 m ද ඉක්බිති උතුරු දෙසට 9 m ද අවසානයේ නැගෙනහිර දෙසට 7 m ද ඇවිද ගොස් පිටියේ පන්දු රැකීමට සැරසෙයි. රමේෂ් හා පන්දු යවන්නාගේ කෙළවරෙහි පිහිටි කඩුල්ල අතර දුර කොපමණ ද?

(1) 21 m (2) 19 m (3) 16 m (4) 15 m (5) 12 m


**26.** ළමයින් කණ්ඩායමක් ගැහැනු ළමයින් 10 දෙනකුගෙන් හා පිරිමි ළමයින් 15 දෙනකුගෙන් සමන්විත වේ. ගැහැනු ළමයින්ගේ වයසේ සාමාන්‍යය අවුරුදු 8 යි මාස 4 ක් වන අතර, පිරිමි ළමයින්ගේ වයසේ සාමාන්‍යය අවුරුදු 8 යි මාස 9 කි. මෙම ළමයින් කණ්ඩායමේ සාමාන්‍ය වයස කීය ද?

(1) අවුරුදු 8 යි මාස $8\frac{1}{2}$ යි (2) අවුරුදු 8 යි මාස 7 යි (3) අවුරුදු 8 යි මාස $6\frac{1}{2}$ යි
(4) අවුරුදු 8 යි මාස 6 යි (5) අවුරුදු 8 යි මාස 5 යි

**27.** වෘත්තාකාර පථයක එක ම ස්ථානයකින් එක ම මොහොතේ පටන්ගෙන, එම පථය දිගේ දක්ෂිණාවර්ත ව ඒකාකාර වේගවලින් රාජ් ඇවිද ගිය අතර, සේරා දිව ගියා ය. රාජ් සිය පළමු වටය සම්පූර්ණ කරන විට සේරා දෙවරක් ඔහු පසු කර ගොස් තිබුණි. සේරා දිව ගිය වේගය,


(1) රාජ් ඇවිද ගිය වේගයෙහි දෙගුණයට වඩා වැඩි නමුත් තුන්ගුණයට වඩා අඩු ය.
(2) රාජ් ඇවිද ගිය වේගය මෙන් හරියට ම තුන්ගුණයකි.
(3) රාජ් ඇවිද ගිය වේගය මෙන් හරියට ම දෙගුණයකි.
(4) රාජ් ඇවිද ගිය වේගයෙහි තුන්ගුණයට වඩා වැඩි ය.
(5) රාජ් ඇවිද ගිය වේගයෙහි දෙගුණයට වඩා අඩු ය.

**28.** තරම $1\ m^3$ ක් වූ ඝනක හයක් රූපයේ දක්වා ඇති හැඩයේ ආකාරයට පොළොව මත අසුරා ඇත. නිරාවරණය වූ මුළු පෙදෙසේ ම තීන්ත ආලේප කර ඇත්නම්, තීන්ත ආලේප කරන ලද හැඩයේ පෘෂ්ඨ වර්ගඵලය කුමක් ද?



(1) $21\ m^2$ (2) $18\frac{1}{2}\ m^2$ (3) $20\ m^2$
(4) $19\ m^2$ (5) $17\ m^2$

**29.** දී ඇති අනුක්‍රමයේ ගිලිහී ඇති රූපය කුමක් ද?




(1)


(2)


(3)



(4)


(5)



Department of Examinations Sri Lanka

**30.** පහත දී ඇති කුමන ඝනකය, දී ඇති පතරොමෙන් සෑදිය **නො හැකි** ද?



(1) (2) (3) (4) (5)

**31.** පලතුරු පානයක් සකස් කිරීම සඳහා සාන්ද්‍ර දොඩම් යුෂ, සාන්ද්‍ර අන්නාසි යුෂ සහ ජලය, 1 : 2 : 3 යන පරිමා අනුපාතයට මිශ්‍ර කරනු ලැබේ. මෙම පලතුරු පානයෙහි ලීටර 1200 ක් සකස් කිරීමට අවශ්‍ය සාන්ද්‍ර අන්නාසි යුෂ පරිමාව ලීටර කීය ද?
(1) 600 (2) 500 (3) 400 (4) 300 (5) 200

- ප්‍රශ්න අංක **32** සහ **33,** පහත දී ඇති තොරතුරු මත පදනම් වේ.

එක්තරා දිනක රෝහලක බාහිර රෝගී අංශයට ඇතුළු වූ රෝගීන් 140 දෙනකුගෙන් 66 කට දියවැඩියා රෝගය ද 79 කට අධි රුධිර පීඩනය ද 48 කට වෙනත් ආබාධ ද තිබුණි.

**32.** පහත සඳහන් කුමන ප්‍රකාශය අනිවාර්යයෙන් ම සත්‍ය වේ ද?
(1) දියවැඩියාව හෝ අධි රුධිර පීඩනයෙන් හෝ පෙළෙන රෝගීන්ගෙන් අවම වශයෙන් එක් පුද්ගලයෙක්වත් වෙනත් ආබාධයකින් පෙළෙයි.
(2) දියවැඩියාව ඇති සමහර රෝගීන්ට අධි රුධිර පීඩනය නොමැත.
(3) අවම වශයෙන් රෝගීන් 27 දෙනකුට දියවැඩියාව, අධි රුධිර පීඩනය සහ වෙනත් ආබාධයක් ඇත.
(4) දියවැඩියාව ඇති රෝගීන්ගෙන් අඩකට වඩා වැඩි සංඛ්‍යාවකට අධි රුධිර පීඩනය තිබේ.
(5) කිසිදු රෝගියකුට ඇදුම රෝගය නොමැත.

**33.** රෝගීන් 42 දෙනකුට දියවැඩියාව පමණක් ද රෝගීන් 13 දෙනකුට අධි රුධිර පීඩනය හා දියවැඩියාව යන දෙක ම ද වැළඳී ඇත්නම්, අධි රුධිර පීඩනය නොමැති නමුත් දියවැඩියාව හා වෙනත් ආබාධයක් සහිත රෝගීන් ගණන කීය ද?
(1) 11 (2) 12 (3) 13 (4) 14 (5) 15

- ප්‍රශ්න අංක **34** සහ **35,** පහත තොරතුරු මත පදනම් වේ.


2013 සිට 2015 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂි නිෂ්පාදන එක එකක සමස්ත නිෂ්පාදනය ආසන්න වශයෙන් පහත වගුවේ දක්වා ඇත.

| **වර්ෂය** | **තේ ( kg මිලියන)** | **රබර් ( kg මිලියන)** | **පොල් (ගෙඩි මිලියන)** |
|---|---|---|---|
| 2013 | 340 | 130 | 2513 |
| 2014 | 338 | 99 | 2870 |
| 2015 | 329 | 89 | 3056 |

**34.** 2014 සිට 2015 දක්වා පොල් නිෂ්පාදනය වැඩි වී ඇති ප්‍රතිශතය ආසන්න වශයෙන් කොපමණ ද?
(1) 2% (2) 4% (3) 6% (4) 8% (5) 10%

**35.** දී ඇති කාල ප්‍රාන්තරය තුළ වාර්ෂික සමස්ත තේ නිෂ්පාදනයේ සාමාන්‍ය අගය කිලෝග්‍රෑම් මිලියනවලින් කොපමණ ද?
(1) 329 (2) 336 (3) 337 (4) 338 (5) 340

- ප්‍රශ්න අංක **36** සහ **37** සඳහා, එක ම නිෂ්පාදනයක සර්වසම ඒකක නිපදවන යන්ත්‍ර දෙකක ක්‍රියාකාරි කාල පෙන්නුම් කරන පහත ප්‍රස්තාරය සලකන්න.




**36.** පෙ. ව. 8.00 සිට ප. ව. 1.00 දක්වා පළමු යන්ත්‍රයේ සහ දෙවන යන්ත්‍රයේ ක්‍රියාකාරි කාල අතර අනුපාතය කුමක් ද?
(1) 5 : 6 (2) 5 : 7 (3) 6 : 5 (4) 7 : 5 (5) 8 : 7

**37.** පෙ. ව. 8.00 සිට ප. ව. 1.00 දක්වා පළමු යන්ත්‍රය සහ දෙවන යන්ත්‍රය මගින් නිෂ්පාදනය කරනු ලැබූ ඒකක ගණන් පිළිවෙළින් $U_1$ සහ $U_2$ මගින් නිරූපණය වේ. පළමු යන්ත්‍රය දෙවන යන්ත්‍රයට වඩා කාර්යක්ෂම බව තහවුරු කරන්නේ පහත දැක්වෙන කවරක් ද?
(1) $U_1:U_2 = 1000:750$ (2) $U_1:U_2 = 1200:1000$ (3) $U_1:U_2 = 1300:1000$
(4) $U_1:U_2 = 1500:1000$ (5) $U_1:U_2 = 2000:1500$

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

**38.** විස්මලන්තයේ මදුරු ගහණය සෑම මසකට ම $\frac{1}{3}$ බැගින් අඩු වේ. 2015 ඔක්තෝබර් 01 වැනි දින මදුරු ගහණය 300 බව සොයා ගනු ලැබිණි නම්, 2015 ජූලි 01 වැනි දින මදුරු ගහණය කොපමණ වී ද?

(1) 100 (2) 900 (3) 2700 (4) 8100 (5) 24300

**39.** පහත එකතුවෙහි එන $d$ සංඛ්‍යාංකය කුමක් ද?

$$\begin{array}{r} a\ b\ c \\ +\ a\ b\ c\ d \\ \hline 2\ 0\ 1\ 6 \end{array}$$

(1) 1 (2) 2 (3) 3 (4) 4 (5) 5

- ප්‍රශ්න අංක **40** සහ **41,** පහත දී ඇති ඡේදය මත පදනම් වේ.

ජාතීන් අතර සුහදතාව සඳහා වන සංගමයේ කමිටු සාමාජිකයින් වන්නේ අනිල්, නීලා, කුමාර්, උමයිර් සහ ෂැනොන් ය. මෙම කමිටුව සභාපති, ලේකම්, භාණ්ඩාගාරික, කැඳවුම්කරු සහ මාධ්‍ය ප්‍රකාශක යන තනතුරුවලින් සමන්විත වේ. පසුගිය වාර්ෂික මහා සභා රැස්වීමේ දී මාධ්‍ය ප්‍රකාශක කුමාර් වැඩියෙන් ම කතා කළ අතර, අඩුවෙන් ම කතා කළේ භාණ්ඩාගාරික ය. අනිල් කැඳවුම්කරුට වඩා වැඩියෙන් කතා කළ නමුත් සභාපතිට වඩා අඩුවෙන් කතා කළේ ය.

**40.** කමිටුවේ ලේකම් තනතුර දරන්නේ,

(1) ෂැනොන් ය. (2) අනිල් ය. (3) නීලා ය. (4) කුමාර් ය. (5) උමයිර් ය.

**41.** මීට අමතර ව නීලා සහ උමයිර් යන දෙදෙනා ම ෂැනොන්ට වඩා අඩුවෙන් කතා කළහ. මෙම කමිටුවේ සභාපති තනතුර දරන්නේ,

(1) ෂැනොන් ය. (2) අනිල් ය. (3) නීලා ය. (4) කුමාර් ය. (5) උමයිර් ය.

- ප්‍රශ්න අංක **42** සහ **43,** පහත විස්තරය මත පදනම් වේ.

චිත්‍රපට සමාගමක් පහත චිත්‍රපට තුන නිෂ්පාදනය කිරීමට තීරණය කරයි.

* උණුදිය පොකුණ * මිරිදිය පොකුණ * ලුණුදිය පොකුණ

රංගන ශිල්පියකුගෙන්, රංගන ශිල්පිනියකගෙන්, සංගීතඥයකුගෙන්, කැමරා ශිල්පියකුගෙන් සහ සංස්කරණ ශිල්පියකුගෙන් සමන්විත ශිල්පි කණ්ඩායමක් මෙම චිත්‍රපට සමාගමට ඇත. එම කණ්ඩායමේ පහත සඳහන් ඉල්ලීම් සහ කොන්දේසි සැලකීමෙන් පසු ව සමාගම ඔවුන් එම චිත්‍රපට සඳහා අනුයුක්ත කර, අනෙකුත් ශිල්පීන් බාහිරින් බඳවා ගනු ලැබේ.

(a) රංගන ශිල්පිනිය පෙනී සිටිනුයේ එක් චිත්‍රපටයක පමණි.
(b) රංගන ශිල්පියා උණුදිය පොකුණෙහි පෙනී සිටින්නේ නම්, රංගන ශිල්පිනිය එහි පෙනී නො සිටිනු ඇත.
(c) සංගීතඥයා ලුණුදිය පොකුණෙහි සංගීත නිර්මාණය කරනු ඇත.
(d) රංගන ශිල්පියා සහ කැමරා ශිල්පියා යන දෙදෙනාගෙන් එක් අයකු පමණක් ලුණුදිය පොකුණට දායක වනු ඇත.
(e) කැමරා ශිල්පියා සහ සංගීතඥයා යන දෙදෙනා එක ම චිත්‍රපටයට දායක වීම ප්‍රතික්ෂේප කරනු ඇත.

**42.** සුදුසු අනුයුක්ත කිරීමක් වන්නේ පහත කවරක් ද?

| | උණුදිය පොකුණ | මිරිදිය පොකුණ | ලුණුදිය පොකුණ |
|---|---|---|---|
| (1) | රංගන ශිල්පියා, රංගන ශිල්පිනිය, සංස්කරණ ශිල්පියා | රංගන ශිල්පියා, සංගීතඥයා, සංස්කරණ ශිල්පියා | සංගීතඥයා, කැමරා ශිල්පියා, සංස්කරණ ශිල්පියා |
| (2) | රංගන ශිල්පිනිය, කැමරා ශිල්පියා, සංස්කරණ ශිල්පියා | රංගන ශිල්පියා, කැමරා ශිල්පියා, සංස්කරණ ශිල්පියා | රංගන ශිල්පිනිය, සංගීතඥයා, සංස්කරණ ශිල්පියා |
| (3) | රංගන ශිල්පියා, කැමරා ශිල්පියා, සංස්කරණ ශිල්පියා | රංගන ශිල්පිනිය, කැමරා ශිල්පියා, සංස්කරණ ශිල්පියා | රංගන ශිල්පියා, සංගීතඥයා, සංස්කරණ ශිල්පියා |
| (4) | රංගන ශිල්පියා, කැමරා ශිල්පියා, සංස්කරණ ශිල්පියා | රංගන ශිල්පියා, සංගීතඥයා, සංස්කරණ ශිල්පියා | රංගන ශිල්පියා, රංගන ශිල්පිනිය, සංස්කරණ ශිල්පියා |
| (5) | රංගන ශිල්පියා, කැමරා ශිල්පියා, සංස්කරණ ශිල්පියා | සංගීතඥයා, කැමරා ශිල්පියා, සංස්කරණ ශිල්පියා | රංගන ශිල්පිනිය, සංගීතඥයා, කැමරා ශිල්පියා |

**43.** පහත අනුයුක්ත කිරීම සලකන්න.

| උණුදිය පොකුණ | මිරිදිය පොකුණ | ලුණුදිය පොකුණ |
|---|---|---|
| රංගන ශිල්පිනිය | සංස්කරණ ශිල්පියා | රංගන ශිල්පියා |
| a | c | සංගීතඥයා |
| b | d | e |

පහත කවරක් අනිවාර්යයෙන් ම සත්‍ය වේ ද?

(1) a = කැමරා ශිල්පියා (2) b = සංගීතඥයා (3) c = රංගන ශිල්පියා
(4) d = රංගන ශිල්පිනිය (5) e = සංස්කරණ ශිල්පියා



Department of Examinations Sri Lanka

**44.** පහත නිරීක්ෂණ-නිගමන යුගලවලින් **සැම විට ම සත්‍ය නො වන්නේ** කවරක් ද?

| | **නිරීක්ෂණය** | **නිගමනය** |
|---|---|---|
| (1) | ඝනකයක පරිමාව 8 $cm^3$ වේ. | එහි පැත්තක දිග 2 cm වේ. |
| (2) | වෘත්තයක පරිධිය 8 $\pi$ cm වේ. | එහි අරය 4 cm වේ. |
| (3) | තලයක් මත ඇඳි සරල රේඛා තුනක් ලක්ෂ්‍ය දෙකක දී පමණක් ඡේදනය වේ. | එයින් රේඛා දෙකක් එකිනෙකට සමාන්තර වේ. |
| (4) | ඍජුකෝණී ත්‍රිකෝණයක පාද දෙකක දිග 4 cm සහ 5 cm වේ. | අනෙක් පාදයෙහි දිග 3 cm වේ. |
| (5) | සමචතුරස්‍රයක සෙන්ටිමීටරවලින් මනිනු ලැබූ පරිමිතිය, වර්ග සෙන්ටිමීටරවලින් මනිනු ලැබූ එහි වර්ගඵලය මෙන් දෙගුණයක් වේ. | එහි පැත්තක දිග 2 cm වේ. |

**45.** ශ්‍රී ලංකාවේ අත්දුටු අසාමාන්‍ය අධික උෂ්ණත්ව ගැන අදහස් පළ කරමින් එක්තරා පුවත්පතක් නිගමනය කර සිටියේ, එම තත්ත්වයට මූලික හේතුව අවිධිමත් වර්ෂාපතන රටා බවයි.
පහත කුමන ප්‍රකාශය සත්‍ය වුවහොත් පුවත්පත පළ කළ එම නිගමනයේ විශ්වසනීය බව බෙහෙවින් ම අඩු වේ ද?

(1) එවැනි ම උෂ්ණත්ව වැඩි වීමක් අත්දුටු ඉන්දියානු ප්‍රාන්තයක් වන කේරළයේ වර්ෂාපතන රටා බෙහෙවින් විධිමත් විය.
(2) ශ්‍රී ලංකාවේ වර්ෂාපතන රටා අධ්‍යයනය කර ඇත්තේ පසුගිය වසර විස්සක කාලය තුළ පමණි.
(3) මෝටර් වාහනවලින් අධික ව මුදා හරිනු ලබන විමෝචන ද්‍රව්‍යවලින් ශ්‍රී ලංකාවේ වර්ෂා චක්‍රයට නිරන්තරයෙන් බාධා ඇති වෙයි.
(4) අවිධිමත් වර්ෂාපතන රටා මගින් කාලගුණයට වඩා අයහපත් බලපෑමක් ඇති වන්නේ කෘෂිකර්මයට ය.
(5) උෂ්ණත්වය වැඩි වීමට එක ම හේතුව වර්ෂාපතන රටාවල අවිධිමත් භාවය නො වේ.

● අංක **46** සහ **47** ප්‍රශ්න සඳහා පහත සඳහන් ඡේදය කියවන්න.

දැඩි නියගය අවසන් වීමත් සමග ඇදවැටුණු දරුණු කුණාටු වර්ෂා මගින් හට ගත් ගංවතුර හා නායයෑම් හේතුවෙන් විශාල මරණ සංඛ්‍යාවක් සිදු වී, තවත් දහස් සංඛ්‍යාත ජනයාට උන්හිටි තැන් අහිමි විය. මෙලෙස 2016 මැයි මාසය තුළ ශ්‍රී ලංකාව දිගින් දිගට ම නොයෙක් කාලගුණික ව්‍යසනවලට මුහුණ දුන්නේ ය. ක්ෂණික ගංවතුර, තද සුළං හා අකුණු ගැසීම් මගින් ඇති වූ විනාශකාරී තත්ත්වය, නාගරික හා තදාසන්න මාර්ග ගණනාවක් ඒවායේ ගමන් කිරීමට නො හැකි තත්ත්වයකට තාවකාලික ව පත් කළේ ය.
1956 වර්ෂයේ දී ආසන්න වශයෙන් අක්කර මිලියන 16 ක් වූ ශ්‍රී ලංකාවේ මුළු බිම් ප්‍රමාණයෙන් අක්කර මිලියන 7 ක ප්‍රමාණයක් වනාන්තරවලින් වැසී තිබුණි. පසුගිය වසර 60 තුළ එය 44% සිට 17% දක්වා අඩු වී ඇති අතර, අද වන විට වනාන්තරවලින් වැසී ඇති ප්‍රමාණය අක්කර මිලියන 3 ක් පමණ වේ.
වැලි ගොඩ දැමීම, කඩොලාන විනාශ කිරීම, ජලය රැඳෙන ස්ථාන ගොඩ කිරීම හා පවතින ජලවහන පද්ධතිය අවහිර වන සේ සිදු කරන නීති විරෝධී ඉදිකිරීම් හේතුවෙන් ස්වභාවික විපත් උග්‍ර වී ඇත.

**46.** ඡේදයට අනුව, දේශගුණික විපත් ඇති වන්නේ,
(1) කාලගුණ දේවතාවා ශ්‍රී ලාංකිකයන් සමග උරණ වීම හේතුවෙනි.
(2) ශ්‍රී ලංකාව හා නැගෙනහිර ඉන්දියාව හරහා බංග්ලාදේශයට කුණාටු හමා යාමෙනි.
(3) ගංවතුර මුහුදට ගලා යාම කුණු කඳු නිසා අවහිර වීමෙනි.
(4) වන ආවරණය හායනය වීම, කඩොලාන විනාශ වීම සහ ජලවහන පද්ධති අවහිර වීමෙනි.
(5) තද වැසි පවතින අවස්ථාවල කඳුකර ප්‍රදේශයන්හි කඳු මුදුන්වල වැඩිපුර ඇති පස් පහළට ගලා ඒමෙනි.

**47.** මෙම ඡේදය සවිස්තරාත්මක ව ප්‍රකාශ **නො කරන්නේ**,
(1) නීති විරෝධී ගොඩනැගිලි ඉදිකිරීම් පිළිබඳ ව ය.
(2) මුහුදට ආසන්න ව භූගත ජලවහන පද්ධති දෙකක් ඉදිකිරීම පිළිබඳ ව ය.
(3) ජලය එක්රැස් වන ස්ථාන ගොඩ කිරීම පිළිබඳ ව ය.
(4) වනාන්තර ආවරණය 20% ට වඩා අඩු වීම පිළිබඳ ව ය.
(5) 2016 මැයි මාසය තුළ අධික උෂ්ණය සහිත නියගය ද තද වැසි, ගංවතුර හා නායයෑම් ද ඇති වීම පිළිබඳ ව ය.

**48.** 'FTDBQFE' යන අකුරු පෙළකින් බුද්ධි අංශ සාමාජිකයකුට සංකේතමය පණිවිඩයක් ලැබුණි. එය 'ESCAPED' ලෙස පරිවර්තනය කෙරිණි. ඔහුගේ ප්‍රතිචාර පණිවිඩය වන 'GPVOE' හි පරිවර්තනය පහත කුමන වචනය ද?
(1) FOUND (2) ERASE (3) GUIDE (4) FIGHT (5) GROUP

● අංක **49, 50** සහ **51** යන ප්‍රශ්නවල නිගමනයක් ද I, II හා III ලෙස අංක කරන ලද තොරතුරු කාණ්ඩ තුනක් ද දී ඇත.

* තොරතුරු කාණ්ඩ තුනෙන් එක් කාණ්ඩයකින් පමණක් නිගමනයට එළඹිය හැකි නම්, *A* තෝරන්න.
* තොරතුරු කාණ්ඩ I හා II එක වර භාවිත කිරීමෙන් නිගමනයට එළඹිය හැකි නම්, *B* තෝරන්න.
* තොරතුරු කාණ්ඩ I හා III එක වර භාවිත කිරීමෙන් නිගමනයට එළඹිය හැකි නම්, *C* තෝරන්න.
* තොරතුරු කාණ්ඩ II හා III එක වර භාවිත කිරීමෙන් නිගමනයට එළඹිය හැකි නම්, *D* තෝරන්න.
* තොරතුරු කාණ්ඩ I, II හා III එක වර භාවිත කිරීමෙන් නිගමනයට එළඹිය හැකි නම්, *E* තෝරන්න.

Department of Examinations Sri Lanka

**49.** නිගමනය : 2016 වර්ෂයේ මැයි මස මැද භාගයේ ඇති වූ මහ වැසි හේතුවෙන්, දිස්ත්‍රික්ක පහක් නායයෑමෙන් බරපතල ලෙස විපතට පත් විය.

I. 2016 වර්ෂයේ මැයි මස මැද භාගයේ ශ්‍රී ලංකාවේ සමහර ප්‍රදේශවලට පැය 24 පුරාම 350 mm ක් දක්වා වූ වර්ෂාපතනයක් ලැබුණි.
II. 2016 මැයි මාසයේ දී කෑගල්ල, රත්නපුර, කළුතර, බදුල්ල සහ මහනුවර යන දිස්ත්‍රික්ක, ගංවතුර සහ නායයෑම් හටගැන්වූ කුණාටු වර්ෂාවලින් තදබල ලෙස විපතට පත් විය.
III. 2016 වර්ෂයේ මැයි මස මැද භාගයේ ඇති වූ වර්ෂාව නිසා 2016 අප්‍රේල්/මැයි මාසවල රට තුළ පැවති තද උණුසුම් තත්ත්වය අඩු වී ගියේ ය.

(1) *A* (2) *B* (3) *C* (4) *D* (5) *E*

**50.** නිගමනය : පෞද්ගලික බස් ප්‍රවාහන සේවය රාජ්‍ය බස් ප්‍රවාහන සේවය ඌන පූරණය කරයි.

I. පෞද්ගලික බස් සේවය ලාභදායී නො වන බස් මාර්ග ආවරණය නො කරයි.
II. රාජ්‍ය ප්‍රවාහන සේවය සතු ව ඇති බස් රථ සංඛ්‍යාව පමණක් මගී අවශ්‍යතා සපුරාලීමට ප්‍රමාණවත් නො වේ.
III. රජය බස් ගාස්තු සහ ධාවන කාල සටහන් සම්බන්ධයෙන් පෞද්ගලික බස් හිමියන් සමග වරින් වර එකඟතාවන්ට පැමිණෙයි.


(1) *A* (2) *B* (3) *C* (4) *D* (5) *E*

**51.** නිගමනය : 2015 අගෝස්තු අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී තාක්ෂණවේදය සඳහා විද්‍යාව (ST) සඳහා ඉදිරිපත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව, ජෛව පද්ධති තාක්ෂණවේදය (BT) සඳහා ඉදිරිපත් වූ ශිෂ්‍ය සංඛ්‍යාවට වඩා වැඩි ය.

I. ඉංජිනේරු තාක්ෂණවේදය (ET) සඳහා ඉදිරිපත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT) සඳහා ඉදිරිපත් වූ ශිෂ්‍ය සංඛ්‍යාවට වඩා අඩු ය.
II. BT සඳහා ඉදිරිපත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව, ET සඳහා ඉදිරිපත් වූ ශිෂ්‍ය සංඛ්‍යාවට වඩා අඩු ය.
III. ST සඳහා ඉදිරිපත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව, ET සඳහා ඉදිරිපත් වූ ශිෂ්‍ය සංඛ්‍යාවට වඩා වැඩි ය.

(1) *A* (2) *B* (3) *C* (4) *D* (5) *E*

- ප්‍රශ්න අංක **52** සහ **53** සඳහා පිළිතුරු සැපයීමට පහත දී ඇති සංඥා අධ්‍යයනය කරන්න.




*A* *B* *C* *D* *E* *F*

**52.** පහත කුමන යුගලය, ඉතිරි කිරීමේ ගිණුම් පහසුකම් සපයයි ද?
(1) *A* සහ *E* (2) *B* සහ *C* (3) *C* සහ *D* (4) *D* සහ *E* (5) *E* සහ *F*


**53.** (a) සිට (d) දක්වා පහත දී ඇති ඒවා නිරූපණය කෙරෙන සංඥාවලට අනුරූප වන ඉංග්‍රීසි අක්ෂර, අනුපිළිවෙළට පෙළ ගස්වන්න.

(a) නිවාස දේපොළ (b) පදික මාර්ගයේ පුවරුව
(c) ජාතික ඉතිරි කිරීමේ බැංකුව (d) වාහන විකිණීම

(1) *BEDC* (2) *BDFC* (3) *BDAC* (4) *BEFC* (5) *BDEC*

**54.** සංකල්පීය ව වෙනස් අනුක්‍රමය තෝරන්න.
(1) බිත්තරය ⟶ කීටයා ⟶ පිලවා ⟶ සලබයා
(2) බීජය ⟶ ගස ⟶ බීජය ⟶ ගස
(3) රෝදය ⟶ කරත්තය ⟶ වාෂ්ප යන්ත්‍රය ⟶ මෝටර් රථය
(4) දඩයක්කාරයා ⟶ එඬේරා ⟶ ගොවියා ⟶ ශිල්පියා
(5) මහා පිපුරුම ⟶ උප පරමාණුක අංශු ⟶ පරමාණු ⟶ චක්‍රාවාට

**55.** කිසියම් සිද්ධියකට අදාළ පින්තූර හයක් පහත දී ඇත. පින්තූරවල නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන වරණය තෝරන්න.



*A* *B* *C* *D* *E* *F*

(1) *CBAFDE* (2) *EBAFDC* (3) *ECBAFD* (4) *CBEFAD* (5) *EBACFD*

[අටවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

**56.** පහත දැක්වෙන්නේ පන්ති භාර ගුරුවරියක හා සිසුන් අතර පන්ති කාමරයේ දී ඇති වූ සංවාදයක්, අනුපිළිවෙළකින් තොර ව ය. වඩාත් තර්කානුකූල අනුපිළිවෙළක් දැක්වෙන වරණය තෝරන්න.

*A* - සුබ උදෑසනක්, ගුරුතුමියනි.
*B* - තමාරා, පාර්ලිමේන්තු මන්ත්‍රී මණ්ඩලයේ මුළු ගණන කීයදැ යි කියන්න.
*C* - සාමාජිකයින් 225 යි, ගුරුතුමියනි.
*D* - සුබ උදෑසනක්, දරුවනි. අප පසුගිය පන්තියේ සාකච්ඡා කළ මාතෘකාව මොකක් ද කියන්න.
*E* - ගුරුතුමියනි, ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු මන්ත්‍රීන් ගැන අප ඉගෙන ගත්තා.
*F* - පද්මා, වැඩි ම පාර්ලිමේන්තු මන්ත්‍රීන් සංඛ්‍යාවක් ඉන්නේ කොයි මැතිවරණ දිස්ත්‍රික්කයේ ද; ඒ කී දෙනෙක් ද?
*G* - ගුරුතුමියනි, කොළඹ දිස්ත්‍රික්කයේ; සාමාජිකයින් 19 දෙනෙක්.
*H* - අරුණි, 225 දෙනාගෙන් කී දෙනකු ඡන්දයෙන් පත් වූ අය ද?
*I* - ගුරුතුමියනි, 196 දෙනෙක් කෙලින් ම ඡන්දයෙන් පත් වූ අය.
*J* - තාර්ෂි, අඩු ම පාර්ලිමේන්තු මන්ත්‍රීන් සංඛ්‍යාවක් ඉන්නේ කොයි මැතිවරණ දිස්ත්‍රික්කයේ ද; ඒ කී දෙනෙක් ද?
*K* - ගුරුතුමියනි, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ; සාමාජිකයින් 4 දෙනෙක්.

(1) *ADEHIBCFGJK* (2) *ADEFGHIBCJK* (3) *ADEJKFGHIBC*
(4) *ADEBCFKJGHI* (5) *ADEBCHIFGJK*

- ප්‍රශ්න අංක **57** සහ **58** සඳහා පහත දී ඇති වගන්ති කියවන්න.

*A* - කමල් ආරම්භක පිතිකරුවා විය.
*B* - පුහුණුකරු කණ්ඩායම කුඩා කණ්ඩායම්වලට බෙදා, ඔවුන්ට පුහුණු වීමට අවස්ථාව ලබා දුන්නේ ය.
*C* - කමල් පිත්තක් සහ බෝලයක් ගෙන බෑගයට දමා ගත්තේ ය.
*D* - කමල්ගේ කණ්ඩායම කඩුලු 4 කට ලකුණු 55 ක් ලබා ගත්තේ ය.
*E* - පුහුණුකරු ඔවුන් ව එක් කණ්ඩායමකට හයදෙනා බැගින් කණ්ඩායම් දෙකකට වෙන් කර, ඕවර 10 බැගින් වන සුහද තරගයකට සූදානම් කළේ ය.
*F* - කමල් තම යතුරු පැදියෙන් ක්‍රීඩා පිටියට ගියේ ය.
*G* - කමල් ඊළඟ තරගයේ කඩුලු රකින්නා වූයේ ය.
*H* - කමල්ගේ කණ්ඩායම තරගයේ ජයග්‍රාහක කණ්ඩායම බව පුහුණුකරු ප්‍රකාශ කළේ ය.
*I* - පුහුණුකරු කණ්ඩායම ශරීර අභ්‍යාසයේ යෙදවූ අතර, කමල් අභ්‍යාසවලට සම්බන්ධ වූයේ ය.
*J* - වර්ෂාව හේතුවෙන් තරගය නතර කරන විට විමල්ගේ කණ්ඩායම ඕවර 8 කට ලකුණු 30 ක් ලබා සිටියේ ය.

**57.** පුහුණුවීම් දක්වා වගන්ති අනුපිළිවෙළ නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

(1) *C, A, B* (2) *F, C, B* (3) *I, B, E* (4) *F, I, B* (5) *E, I, B*

**58.** පුහුණුකරු තරගයේ ජයග්‍රාහකයා ප්‍රකාශ කිරීමට යොමු කරවූ සිද්ධිවලට අදාළ වගන්තිවල අනුපිළිවෙළ නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

(1) *E, A, G* (2) *A, G, D* (3) *E, I, D* (4) *G, J, D* (5) *E, D, J*

- අංක **59** සහ **60** යන එක් එක් ප්‍රශ්නයේ, වගන්ති තුන බැගින් ඇති කෙටි ඡේද පහක් දී ඇත. ඉන් එක් ඡේදයක ඇති වගන්ති තුන පමණක් තර්කානුකූල සම්බන්ධයක් දැක්වෙන පරිදි නැවත සකස් කළ හැකි ය. තර්කානුකූල සම්බන්ධයක් දැක්වෙන පරිදි නැවත සකස් කළ හැකි වගන්ති සහිත ඡේදය තෝරන්න.

**59.** (1) වසරකට දෙවතාවක් අඹ ගස් පල දරයි. වසරකට එක් වතාවක් කජු ගස් පල දරයි. අඹ ගෙඩි, කජු ගෙඩිවලට වඩා විශාල ය.

(2) වී යනු වර්ෂා ජලයෙන් මෙන් ම වාරි ජලයෙන් ද වගා කෙරෙන බෝගයකි. යල සහ මහ යන කන්න දෙකේ ම වී වගා කළ හැකි ය. යල කන්නයේ වී වගා කිරීම සඳහා වාරි ජලය සපයාගෙන තිබිය යුතු ය.

(3) ලුණු ලේවායන්හි මුහුදු හෝ කලපු ජලය ලුණු ලියැදිවලට පොම්ප කරනු ලැබේ. ලුණු ස්ඵටිකීකරණය ආරම්භ වීම සඳහා නිසි අවස්ථාවේ දී ලුණු ලියැදිවලට ලුණු කුඩු ඉසිනු ලැබේ. ස්වභාවික ක්‍රියාවලිය ඔස්සේ සූර්ය ශක්තියෙන් ජලය වාෂ්ප කෙරේ.

(4) ළමයි උදය කාලයේ පාසල් යති. පාසල් ළමයි සාමාන්‍යයෙන් සවස් කාලයේ විනෝදාත්මක ක්‍රියාකාරකම්වල නියැලෙති. පෙර-පාසල් ළමයින්ට විනෝදාත්මක ක්‍රියාකාරකම් සඳහා නිශ්චිත වේලාවක් නොමැත.

(5) රජය මී මැසි පාලනය දිරි ගන්වයි. මී පැණි සෞඛ්‍යයට හිතකර ය. මී පැණි පරිරක්ෂක ද්‍රව්‍යයකි.

**60.** (1) කෘෂිකර්මය සඳහා සැලකිය යුතු කම්කරු ශ්‍රමයක් අවශ්‍ය ය. වර්තමානයේ දී කෘෂිකර්මය සඳහා කෘෂි යන්ත්‍ර භාවිත කෙරේ. කෘෂි යන්ත්‍ර සෘජු කම්කරු ශ්‍රමයට වඩා ලාභදායි වේ.

(2) ගිලන් රථ සේවාව අමතන ලදි. තරුණයා දුම්රියේ ගැටුණි. සොරකම් කිහිපයක් සඳහා සැකකරුවකු වී ඇති තරුණයෙක් සිය දිවි හානි කරගැනීමට තැත් කළේ ය.

(3) දැරිය තම බයිසිකලයෙන් පාසලට යෑමට නිවසින් පිටත් වූවා ය. දැරියගේ පියා ගුරුවරයෙකි. දියණිය යන්නේ තම පියා උගන්වන පාසලට ය.

(4) තරුන් නගරයේ පිහිටි ප්‍රසිද්ධ යතුරු පැදි අලුත්වැඩියා කිරීමේ මධ්‍යස්ථානයක යාන්ත්‍රික ශිල්පියෙකි. තරුන්ට සිය නිවසේ කුඩා වැඩපලක් ඇත. විවේකී පැයවල සහ වැඩ නො කරන දිනවල තරුන් නිවසේ සිට අලුත්වැඩියා කටයුතු කරයි.

(5) ගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තය ශ්‍රී ලාංකිකයන් බොහෝ දෙනකුට රැකියා අවස්ථා ලබා දෙයි. ශ්‍රී ලංකාව යුරෝපීය රටවලට මසුන් අපනයනය කිරීම යළි ඇරඹා ඇත. රට අභ්‍යන්තර ධීවර කටයුතු ශ්‍රී ලංකාවේ සුලබ ය.

* * *

Department of Examinations Sri Lanka